# 1957 අංක 51 දරණ තේ පාලන පනතේ අංක 02 දරණ වගන්තිය යටතේ තේ ඉඩම් ලියාපදිංචි කිරීම - 2016

ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට ප්‍රථම උපදෙස් පත්‍රිකාව කියවීමට කටයුතු කරන්න.

**අමු තේ දළු කම්හල් වෙත අලෙවි කිරීම, තේ පොහොර සහනාධාර ලබා ගැනීම, කුඩා තේ වතු සමිති සාමාජිකත්වය ලබා ගැනීම ප්‍රමුඛ අනෙකුත් සේවා සැපයීම සඳහා ඔබගේ තේ ඉඩම් ලියාපදිංචි කිරීම ඉතාමත් වැදගත් මෙන්ම අනිවාර්යය වේ.**

**පොදු උපදෙස් :-**

1. මෙම ඉල්ලුම් පත්‍රය ඉඩම් අයිතිකරු විසින් සම්පූර්ණ කළ යුතුය.
2. ඔප්පුවකින් හෝ මානක සැලැස්මකින් වෙන් කර ගත් සෑම ඉඩමක් සඳහාම වක් පෝරමය බැගින් සම්පූර්ණ කරන්න.
   බෙදා වෙන් නොකළ ඉඩමක් නම් අයිතිකරුවන් සියළු දෙනාගේ නම් හා ඊට අදාළ තොරතුරු සපයන්න.
3. තොරතුරු පරිගණකගත කරන බැවින් සියළු තොරතුරු පැහැදිලිව ඉදිරිපත් කරන්න.
4. ඉලක්කම් ලිවීමේදී අංකය ඉතා පැහැදිලිව හඳුනා ගත හැකි වන ලෙස ලියන්න.
5. ඉලක්කම් කැපීම/කුරුටු ගෑම/වක මත ලිවීමෙන් වලකින්න.
6. සෑම විටම කොටුව තුළ ඉලක්කම් ලිවීමේදී අවසාන ඉලක්කම අග කොටුවට ඇතුළත් වන සේ ලියන්න.

උදා:

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 5 | 3 | 1 |

7. ඉල්ලුම් පත්‍රය තමාට තනිවම සම්පූර්ණ කර ගැනීමට අපහසු නම් පැහැදිලිව ලිවිය හැකි අයකුගේ සහාය ලබා ගන්න.
8. ඉල්ලුම් පත්‍රයේ සඳහන් වන ඉඩමට අදාළ වන තොරතුරු පමණක් ඇතුළත් කරන්න.

**ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමේ උපදෙස් :-**

සියළුම ප්‍රශ්න අංක සඳහා තොරතුරු සපයන්න.

1.1 ඉඩම් කැබැල්ලේ නම පමණක් ලියන්න. කට්ටි අංකයක් වෙතොත් 1.13 හි සටහන් කරන්න.

1.2 ඉඩමේ භුක්තියේ ස්වභාවය නිවැරදි කොටුව තුළ " √ "ලකුණින් සටහන් කරන්න.

1.3 ඉඩමේ අයිතිය හා සම්බන්ධ ලේඛනයට අදාල ලියාපදිංචි අංකය (උදා:ඔප්පු අංකය) කොටු තුළ දක්වන්න. අදාල වචනය ඉතිරි කර අනවශ්‍ය කොටස් කපා හරින්න.

1.4 ඉඩමේ අයිතිකරුවන් පිළිබඳ තොරතුරු වගුවෙහි සටහන් කරන්න. (රැකියාවද අනිවාර්යෙන් සඳහන් කරන්න)

1.5,1.6 සම්බන්ධ විය හැකි අයගේ දුරකථන අංක සටහන් කරන්න.ස්ථාවර දුරකතන අංකය සහ ජංගම දුරකථන අංකය නිවැරදිව කොටු තුළ සටහන් කරන්න.

1.7 විද්‍යුත් තැපැල් ලිපිනය ඉංග්‍රීසි භාෂාවෙන් ලියන්න.

1.8 සහනාධාර ගෙවීමකදී මුදල් බැර කළ යුතු ගිණුමේ නම, බැංකුව, ගිණුම් අංකය, බැංකු ශාඛාව සහ බැංකු ශාඛා අංකය පැහැදිලිව සඳහන් කරන්න.

1.9 තේ ඉඩමේ අයිතිකරු ඉඩමේ තේ වගාකරුද යන්න නිවැරදි කොටුව තුළ "√"ලකුණින් සටහන් කරන්න. කරන්න.

1.10 ඉඩමේ අයිතිය සමාගමක් සතු වන්නේ නම් අදාළ සමාගමේ නම සහ ලියාපදිංචි අංකය තිත් ඉරි මත පැහැදිලිව ලියන්න.

1.11 ඉඩම් කැබැල්ලේ මුළු වපසරිය අක්කර ,රූඩ්, පර්චස් වශයෙන් වෙන වෙනම කොටු තුළ සටහන් කරන්න (හෙක්ටාර් 1=අක්කර 2.47)

1.12 ඉඩම සඳහා මානක සැලැස්මක් තිබේ නම් අදාළ අංකය පැහැදිලිව සටහන් කරන්න.

1.13 ඉඩමට අදාළ කට්ටි අංකයක් තිබේ නම් අදාළ අංකය පහැදිලිව සටහන් කරන්න.

1.14 ඉඩම හඳුනා ගැනීමේ විස්තර යටතේ ඇති I සිට vi දක්වා ප්‍රශ්නවලට පිළිතුරු තිත් ඉරි මත පැහැදිලිව ලියන්න.

1.15 කුඩා තේ වතු සමිතියේ සාමාජිකයෙක්ද යන්න නිවැරදි කොටුව තුළ "√"ලකුණින් සටහන් කරන්න.

1.16 කුඩා තේ වතු සංවර්ධන සමිතියේ නම නිවැරදිව සටහන් කරන්න.

2.1 තේ වගා කළ වර්ෂයන් සහ විස්තර අදාළ වගුව තුළ නිවැරදිව සටහන් කරන්න.
තේ වගා සහනාධාර ලබා ගත්තේ නම් ඒ පිළිබඳ විස්තර නිවැරදි කොටුව තුළ " √ "ලකුණින් සටහන් කරන්න.

2.2 තේ පැල සිටුවීමට පෙර තෘණ සිටුවා පස සාරවත් කලේ ද යන්න නිවැරදි කොටුව තුළ " √ "ලකුණින් සටහන් කරන්න.

2.3 ප්‍රශ්න අංක I සහ II ඉඩමේ තේ වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය ඇට තේ, රිකිලි තේ වශයෙන් වෙන්කර දක්වන්න. (හෙක්ටාර් 1=අක්කර 2.47) තේ වගාවේ වයස දළ වශයෙන් සඳහන් කරන්න.

ප්‍රශ්න අංක III ඉඩමේ වගා කර ඇත්තේ රිකිලි තේ නම් එම ප්‍රභේද වර්ග තිත් ඉර මත සටහන් කරන්න.

2.4 තේ වගාව සමඟ යම් අතුරු භෝගයක් වගා කර ඇත්නම් එම අතුරු භෝගය වගා කර ඇති බිම් ප්‍රමාණය සමඟ වගුව තුළ සටහන් කරන්න. උදා: ගම්මිරිස් - පඳුරු සංඛ්‍යාව සටහන් කරන්න.

2.5 ඔබගේ ඉඩමේ පවතින මුළු තේ ගස් ප්‍රමාණය දළ වශයෙන් ගණන් කර එම ප්‍රමාණය අක්කර ගණනින් බෙදා අක්කරයකට තේ පඳුරු සංඛ්‍යාව ලෙස සටහන් කරන්න.

2.6 මුළු තේ ඉඩමේ මසකට ලැබෙන සාමාන්‍ය දළු අස්වනු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් වලින් සටහන් කරන්න.